# පංචායුධ ජාතකය

තවද එක් සමයෙක්හි ජාම්බෝනදවවනියට බදූ වූ ශරීර ප්‍රභා ඇති සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි පසුභට වීර්ය ඇති භික්ෂූන් කෙනෙකු අරඹයා මේ ජාතකය දක්වන ලදී. සර්වඥයන් වහන්සේ මේ භික්ෂූන් ට ආමන්ත්‍රණය කොට සැබෑද මහණ තෝ පසුබට විර්ය ඇත්තේදැයි වදාල සේක. සැබැව ස්වාමිනි කී කල්හි මහණ පෙර නුවණැත්තාවූ මහෝත්තමයෝ විර්ය කරන්න සුදුසු තැන්හි විර්ය කලෝදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකු රාජ්‍ය කරන සමයෙහි අප මහා බෝසතානෝ රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳගත්තුය. ඒ බෝධිසත්වයන්ට නම් තබන දවස් අටොරාෂියක් බමුණන්ගෙන් හා සියළු සත්වයන් වස්තුවෙන් පිනවා ලක්ෂණ විචාලෝය. එකල ලක්ෂණ කීමෙහි දක්ෂ වූ බමුණෝ ලක්ෂණ සම්පත්තිය බලා මාහාපිනැති රාජ කුමාර කෙණෙකුන් වහන්සේ නුඹ වහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දස රාජ ධර්මයෙන් රාජ්‍ය කරන සේකැයි කීය. පංචායුධ යුධ ශිල්පයෙහි දක්ෂව ජම්බුද්වීපයෙහි සත්වයන්ට අග්‍ර පූරුෂ වනසේකැයි කිව්ය. බමුණන්ගේ බස් අසා කුමාරයන්ට නම් තබන්නාහු පංචායුධ කුමාරයෝ යයි නම් තුබූහ. ඉක්බිත්තෙන් ඒ කුමාරයන් මැදිවිය පැමිණි කල්හි රජ්ජුරුවෝ සමීපයට කැඳවා ශිල්පයක් ශාස්ත්‍රයක් නිමවා නොහෙන රාජ්‍යය කළ නොහැක්කේය එසේ හෙයින් ශිල්ප උගනුවයි කීහ. ස්වාමීනි කවුරුන් සමීපයෙහි උගනිම්දැයි කී කල්හි පුත ගන්ධාර දේශයෙහි තක්ෂලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශාස්ත්‍රය ඉගෙන නිමාවට පැමිණ ඉක්බිති ආචාරින් වැඳ තක්ෂලා නුවරින් නික්ම පංචායුධ සන්නද්ධව බරණැසු නුවරට යන්නාහු වනාන්තරගත මාර්ගයට අභිමුඛ වූ කල්හි එසේ පැමිණෙන්නාහු කුමාරයෝ අතරමග සිලේස ලෝම නම් යක්ෂයකු වසන්නාවූ එක් වනයකට පැමිණියෝය. එකල කුමාරයන් වනයට අභිමුඛ වූ කල්හි මනුෂ්‍යයෝ දැක පින්වත් වූ පුරුෂය තෙපි මේ වනාන්තරයට නොවදුවයි මේ වනාත්තරයෙහි සිලේෂ ලෝම නම් යක්ෂයෙන් ඉඳ දුටු දුටුවන් අවුරා අනුභව කරන්නේය එසේ හෙයින් තෙපි නොයවයි වැලකුය.

බෝධිසත්වයන් තමන්ගේ සමර්ථ කම තුමුම වලකා නිර්භීතව කේෂර සිංහ රාජයකුසේ වනයට සාහසිකව පැමිණි කල්හි කැනහිල් මල් කැකුළු සාදල ඇතිව කබර පත් වූ මුඛ හා බඩ ඇතිව නිල් වූ හස්ත පාද ඇති වූ ඕ හට බෝධිසත්වයෝ කියන්නාහු එම්බල යක්ෂය මම මාගේ සමර්ත කම් සලකා මෙතැනට වන්නෙමි. තෝ අප්‍රමාදව මා සමීපයට වර විෂ පොවන ලද ශරීරයකින් විද මෙතනම එලමි ඔහු තැතිගන්වා දරුණු වූ විෂ පොවන ලද ශරය දුනු පිට ලා ගෙන ඇඳ අත හලවා හුය. ඒ සැරය ගොස් යක්ෂයාගේ රෝමයෙහි ඇලි ගියේය. ඉක්බිත්තෙන් අනික් ෂරයක් යයි මෙසේ හී දඬු පනසක් විද්දේය. ඒ සියළුම හී දඬු යක්ෂයාගේ රෝමයෙහිම ඇලි ගියේය. තවද යක්ෂයා ඒ සියළු හී දඬුම කිලිපොලා තමාගේ පා මුල වගුරවා බෝධිසත්වයන් සමීපයට ගියේය. එකල බෝධිසත්වයෝ නැවතත් තැති ගන්වා කඩුව කොපුවෙන් හයා ගෙන ගැසුයේය. දෙතිස් අඟලක් දිග ඇති කඩුව රෝමයෙහි ඇලි ගියේය. එවිට මගුරෙන් ගැසු සේක. එයත් රෝමයෙහි ඇලි ගියේය. ඒ මුගුරු ඇලී ගියාදැක බෝසතානෝ කියන්නාහු පින්වත් වූ යක්ෂය මම පංචායුධ කුමාරයෝය මාගේ නම් ඇසූකෙනෙක් නැත මම තා විසින් අධිගෘහිත වූ වනාන්තරයට වදනෙමි. දුනු ආදී වු ආයුධයක් සලකා වන්නේම් නොවි මාගේ සමර්ත කම සලකාවන්නේ එසේ හෙයින් තා සුනු විසුනු කරමි අධිෂ්ඨානය දක්වා ගර්ජනා කොට දකුණතින් යක්ෂයාට පැහැරී සේක. එයිදු රෝමයෙහි ඇලි ගියේය. වමතින් පහල සේක. එයිදු රෝමයෙහි ඇලි ගියේය. දකුණු පයින් පහල සේක. එයිත් රෝමයෙහි ඇලි ගියේය. වම් පයින් පහර සේක. එයිත් රෝමයෙහි ඇලි ගියේය. ඇන සුනු විසුනු කරමි ඉසින්ද පහලහ. මහබෝසතානෝ පස් තෙනකින් බැඳී එල්ලෙමින් සිටි. නිර්භිතව කතා කෙරෙති. කල යක්ෂයා මෙසේ සිතිය. පුරුෂ සිංහයෙක පුරුෂ ශ්‍රේෂ්ඨයෙක. මේ කෙසේ වූ පුරුෂයෙක්දෝ කියා සිතන්නේ එම්බල පුරුෂය තෝ මට ගොදුරුව සිට මෙසේ වූ බුහුටි කතා කරන්නට කාරණා කවරෙක්ද විචාළේය. එකල්හි බෝධිසත්වයන් වහන්සේ තෝ මා කැයේ වී නම් මාගේ කුක්ෂියෙහි වජ්‍රායුධයක් ඇත්තේය. ලයෙන් ඇනි පිටින් නැගෙන්නේය. තාගේ අතුනුහහන් කඩ කඩ කොට සිඳ ජීවිතක්ෂයට පමුණුවන්නේය. එසේ කල්හි අප දෙදෙනාම නැසෙම්හ. මේ කාරණය මම නොහාම් කිවාහුය. මේ වචනය වූ කලි බෝධිසත්වයන් තමන්ගේ අභ්‍යන්තර යෙහි ඥානායුධය සඳහා කීහ.

ඒ බස් අසා යක්ෂයා මෙසේ සිතීය. මේ මානවකයා සත්‍යයෙක්ම කියන්නේය. පුරුෂ සිංහයාගේ ශරීරයේත් මුං ඇටයක් පමණ අනුභව කළෙම් වීම් නම් මාගේ බඩ දිරවා ගත නොහෙමි. එසේ හෙයින් මොහු හැර පියෙමි සිතා මරණ භයින් ත්‍රස්තව බෝධිසත්වයන් ඇරපියන්නේ මානවකය තෝ සිංහ පුරුෂයෙක තාගේ මස් නොකමි තෝ රාහු මුඛයෙන් මිදුනා හූ චන්ද්‍රයා පරිද්දෙන් මා අතින් මිදි මිත්‍ර සමූහයා සතුටු කරවමින් පලා යවයි කීය. එකල්හි බෝධිසත්වයායන් වහන්සේ ඕ හට මෙසේ කීය. යක්ෂය මම වූ කලියෙන් තෝ වනාහි පෙර අකුශල කොට රවුද්‍ර කර්මයෙන් ලේ රැඳි ගියාහු අත් ඇතිව අනුන්ගේ ශරීර මාංශය භක්ෂනය කරන්නාවූ යක්ෂව උපන්නෙහිය. ඉදින් මේ යක්ෂාත්ම භවයෙහි සිට අකුශල් කරන්නේ වී නම් අඳුරෙන් අඳුරටය යන්නෙහිය. මා දුටු තැන් පටන් තා විසින් අකුසල් කරන්නට නොපිලිවන. ප්‍රාණගාත නම් නරක තිරිසන් ප්‍රේත අසුර කාය යන සතර අපායෙහි උපදවන්නේය. නැවත මනුෂ්‍ය ලෝකයෙහි උපන්තෙන මන්දායුෂ්ක බව ලබන්නේය. මේ ආදී වූ නොයෙක් කාරණයෙන් පංචදුෂ්ශීලයෙහි ආදීනව හා පංච ශීලයෙහි අනුහස් හා අනේක ප්‍රකාරයෙන් යක්ෂයා තැති ගන්වා ධර්ම දේශනා

කොට ඔහු දමනයේලා ඔහුගේ සන්තානයෙහි කෙලෙස් නැමති සතුරන් නසා පංචශීලයෙහි පිහිටවා වනාන්තරයෙහි සත්වයන් විසින් දෙන ලද භෝජනය බිලියම් පිණිස ලැබ අප්‍රමාදව වාසය කරවයි අවවාද කොට වනයෙන් නික්ම මහාවන සමීපයෙහි මනුෂ්‍යන්ට කියා පංචායුධ සන්නද්ධව බරණැස් නුවරට ගොස් දෙමව්පියන් දක මෑත භාගයෙහි රාජ්‍යයෙහි පිහිටවා දැහැමෙන් රාජ්‍ය කරමින් ධානාදී වූ කුසල් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

මෙසේ ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා තවද භික්ෂුන්ට මත්තෙහි අවවාද කරන සේක් නොපසු බටවූවාහු විර්ය ඇති සිතින් නිරවද්‍ය වූ අන්තයෙන් කුසල යයි කියන ලද සප්තත්‍රිංසත් බෝධිපක්ෂික ධර්මයෙන් වඩාද සියළු සංස්කාර ධර්මයන් අනිත්‍යය දුක්ඛය අනාත්මයි අනාත්මයයි මෙසේ ත්‍රිලක්ෂණ මෙනෙහි කර විදර්ශනාවෙහි පටන් බෝධිපාක්ෂික ධර්මයන් වඩන්නාහු යෝගාවචර තෙම සියළු සංයෝජනක්‍ෂයකරන්නා වූ සතර වැනි ආර්ය මාර්ගයාගේ කෙළෙවර උපන් බැවින් ධර්මදේශනාවෙහි කුළු ගන්වා මත්තෙහි චතුරාර්ය සත්‍යය ධර්මයන් ප්‍රකාශ කොට වදාළ සේක. චතුරාර්ය සත්‍යයන්ගේ අවසානයෙහි පසුබට වීර්ය ඇති භික්ෂූහු අරහත් ඵලයෙහි  පිහිටි සේක. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගලපා මේ පංචායුධ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි යක්ෂයා නම් අංගුලි මාල ස්ථිවිරයෝය. පංචායුධ කුමාරයෝ නම් බුදු වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.